2020 නව විෂය නිර්දේශයට අනුකූලව සකස් කරන ලද

5 ශිෂ්‍යත්ව පෙරහුරු ප්‍රශ්න පත්‍ර

❖ **අංක 3 ii පත්‍රය** **කාලය පැය 1 යි මිනිත්තු 15**

(1) ඡේදය ඇසුරින් පිළිතුරු ලියන්න.

ටිකෙන් ටික අඳුර වැඩි වේගෙන එයි. ගස් මුදුන්වල මිහිරි හඬින් ගායනා කරමින් සිටි කුරුල්ලෝ ලැගුම් පළවල් සොයා යති. කැලෑවේ එක් පැත්තක සිට අනික් පැත්තට දුවන්නට එළියට පැමිණි හාවෙක් කන්දෙක උඩ හිඳුවා ගෙන වහා ගමන් ගත් කුමාරයන් දෙදෙනා දෙස බලා සිටියි. කුමාරයන් දෙන්නා බලන්නටත් පෙර හාවා ආපසු කැලයට පැන දුවයි.

දඬුමොනරය- මාර්ටින් වික්‍රමසිංහ

i ඡේදයෙන් කියවෙන්නේ කුමන ස්ථානයක් පිළිබඳවද?--------------------------------------------

ii ප්‍රාණවාචී ඒකවචන නාම පදයක් ලියන්න----------------------------------------------------

iii වර්තමාන කාල බහුවචන ක්‍රියා පදයක් ලියන්න---------------------------------------------

iv ප්‍රාණවාචී බහුවචන උක්ත පදයක් ලියන්න----------------------------------------------------

v සෑම අකුරකටම ඉස්පිල්ල යෙදුණ වචනයක් ලියන්න---------------------------------------------

vi පුරුෂලිංග බහුවචන අනුක්ත පදයක් ලියන්න--------------------------------------------------

vii දවසේ කුමන කාලයක් ගැන මින් කියවේද?---------------------------------------------------

viii ඡේදයට අනුව කුරුල්ලන් කුමක් කරන්නේද?--------------------------------------------------

ix සඤ්ඤක අකුරක් සහිත වචනයක් ලියන්න-------------------------------------------------------

x මෙම ඡේදය ඇතුළත් පොතේ කතුවරයා කවුරුන්ද?-------------------------------------- (ලකුණු 10 )

(2) සමාන පදය බැගින් ලියන්න

i කැලය ---------------------

i iගස්------------------------ (ලකුණු 02 )

(3) අක්ෂර වින්‍යාසය නිවැරදි වචනය යටින් ඉරක් අඳින්න.

i දයිනික ,දෛනික , ධෛනික

ii පෞරානිඛ ,පෞරාණික ,පවුරාණික

iii ශෛලමය ,ශයිලමය ,ශෛලමය (ලකුණු 03 )

(4) වචන මාරු කර ගළපා වැකි තනන්න.

i ටික/ දර /අපි / ඉක්මනින් ම/ගනිමු / ගෙට

--------------------------------------------------------------------------------

ii ලෙසින් /මුතු ඇටය /රට/ අපේ /ඉන්දිය /හඳුන්වයි/සයුරේ

-------------------------------------------------------------------------------- (ලකුණු 02 )

(5) පහත වැකියට සුදුසු විරාම ලකුණු යොදා නැවත ලියන්න.

කවීෂා අපි හැමෝට ම ඇහෙන්න මේ ඡේදය කියවන්න ගුරුතුමිය කීවා ය

------------------------------------------------------------------------------------------------ (ලකුණු 04 )

(6) පහත ප්‍රස්තාව පිරුළුවල හිස්තැනට සුදුසු වචනය ලියන්න.

i රයිගමයයි ............................වගේ

ii ගඟට .......................... කැපුවා වගේ (ලකුණු 02 )

(7) සුදුසු උක්ත පද තෝරා ලියන්න.

( ඔවුහු / ගෙවිලිය / උපාලි )

i ........................... චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීමට ගියේය.

ii ...........................කුඹුරේ වැඩ කළහ.

iii ...........................පැළ සිටුවීමට ගියාය . (ලකුණු 03 )

(8) පහත ඉංග්‍රීසි වගන්තියේ අදහස ලියන්න.

Do you like ice crèam ? ..............................................................................................................

(9) පහත වගන්තිය ඉංග්‍රීසි බසට හරවා ලියන්න.

මේ පැන්සල ඔබගේද? ..............................................................................................................

(10) රූපයට අදාළ ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරු භාවිත කර ලියන්න.



i.................................



ii ................................. (ලකුණු 04 )

(11) පහත දෙමළෙන් දී ඇති වගන්ති සිංහල බසට හරවා ලියන්න.

i සමන් එංගේ ?...............................................................................................................

ii නීංගළ් යාර් ?...............................................................................................................

(12) පහත වගන්තිය දෙමළෙන් කියන අයුරු සිංහල අකුරින් ලියන්න.

i ඔබේ මල්ලී කොහේද?..............................................................................................................

**ii දහතුන** දෙමළ බසින් කියන අයුරු සිංහලෙන් ලියන්න.......................................................... ලකුණු 04 )

(13) "මගේ සුන්දර ගෙවත්ත" යන මාතෘකාව යටතේ වැකි 3ක් ලියන්න .සෑම වැකියක්ම වචන පහකට නොඅඩු විය යුතු අතර උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතුය. (ලකුණු 06 )

..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................

➢ පහත ගැටලු විසඳන්න.

(14) 37 479 හි 4 ඉලක්කමෙන් නිරූපිත අගය කීයද?.......................................................................................

(15)අඹ ගසකින් අඹගෙඩි 2058ක්ද තවත් අඹ ගසකින් අඹ 975ක් ද කඩන ලදි. ගස් දෙකෙන් ම කඩන ලද අඹ ගෙඩි ගණන කීයද? ..............................................................................................

(16) සතියක් තුළ සීගිරිය නැරඹීමට පැමිණි දේශීය සංචාරකයින් ගණන 15 367ක් වූ අතර විදේශීය සංචාරකයින් 21 420කි . පැමිණි දේශීය සංචාරකයින් හා විදේශීය සංචාරකයින් අතර වෙනස කොපමණද?

..............................................................................................

(17)තාත්තා රුපියල් 500.00 මාරුකර 1/2ක් මට ද ඉතිරියෙන් 1/2 මල්ලීට ද දුන්නේ ය. එවිට තාත්තා ළඟ ඉතිරි කීයද? ..............................................................................................

(18)පෙ.ව.7.30 ට පැය බාගයකට පෙර වේලාව සම්මත ආකාරයට ලියන්න.

...........................................................................

(19) පොත් 807ක් එක් ළමයෙකුට 9 බැගින් බෙදා දිය හැකි උපරිම ළමුන් ගණන කීයද?..................................

(20) 5m දිග කඹයක් සමාන කෑලි හතරකට කැපූ පසු එක් කෑල්ලක දිග කොපමණද?......................................

(21)ලීටර 8 ක ධාරිතාවය සහිත ජල බඳුනකින් ලීටර 1මිලිලීටර 375 ඉවතට ගත්තේ නම් ඉතිරි කොපමණද?

..............................................................................................

(22) මාලාත් ,සාමාත් ,රාධාත් තරගයට මල් මාලා ගොතන ලදි .මාලා ගෙතූ මාලය සාමා ගෙතූ මාලයට වඩා 35cm දිගය. රාධා ගෙතූ මාලය මාලා ගෙතූ මාලයට වඩා 18 cm දිගය .සාමා ගෙතූ මාලය 165 cm නම් දිගින් වැඩිම මාලය ගොතා ඇත්තේ කවිද?..............................................................................................

(23) රාධා ගෙතූ මල් මාලයේ දිග කොපමණද?..............................................................................................

(24) හාල් 1kg ක් රුපියල් 85 .00 බැගින් හාල් 3 ½ kg ක්ද පොල් ගෙඩියක් රුපියල් 48 .00 බැගින් පොල් ගෙඩි 6ක්ද ගත් අයෙක් ගෙවිය යුතු මුදල කීයද?..............................................................................................

(25) සුමල්ගේ නිවසේ සිට පාසලට දුර 7 km250mවේ. ඔහු එම දුරින් 850m පයින් ඇවිද එන අතර ඉතිරි දුර බසයෙන් පැමිණේ .එසේ නම් ඔහු බසයෙන් එන දුර කොපමණද?..............................................................

(26) වරකට 2 බැගින් දවසකට තුන් වරක් ගැනීමට පෙති 60ක් රෝගියෙකුට ලැබුණි .මෙම පෙති දින කීයකට සෑහේද?..............................................................




(27) දින පහ තුළ විකුණන ලද පුවත්පත් ගණන කොපමණද?..............................................................

(28) දිනක් තුළ විකුණන ලද වැඩිම පුවත්පත් ප්‍රමාණය හා අඩුම ප්‍රමාණය අතර වෙනස කීයද?.........................................

(ලකුණු 2x 15 )

➢ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(29) මානසික හා කායික සුවපත්භාවය උදෙසා කරනු ලබන ක්‍රියාකාරකම් වලට අයත් නොවේ.

i උදානය ii ප්‍රාර්ථනා iii ආශීර්වාදය

(30) ආහාර පිළියෙල කිරීමේදී තම පිරිසිදු බව හා ආහාරවල පවිත්‍රතාව පවත්වා ගැන්ම සඳහා භාවිත කළ යුතු ඇඳුමකි. i කිමෝනාව ii ඒප්‍රනය iii කබාය

(31) ආහාර අපතේ යා හැකි පාරිසරික හේතුවක් නොවේ.

i දූවිලි වැදීම ii අහිතකර රසායන ද්‍රව්‍ය යෙදීම iii අධික හිරු රැසට නිරාවරණය වීම

(32) වෙළඳ පොළෙන් අප මිලදී ගන්නා භාණ්ඩ ඇසුරුම් දවටනයක දැකිය නොහැකි **දෙයකි** .

i **ප්‍රමිති සහතිකය** ii නිෂ්පාදකයාගේ අත්සන iii භාණ්ඩයේ **මිල**

(33) අතංගුව උපකරණය භාවිත කරන වෘත්තිකයා වන්නේ

i ධීවරයා ii පතල් කාර්මිකයා iii පෙදරේරුවා

(34) ගිරෙන් ගිරට පැන ......වන්නම් ගීයෙන් කියවෙන්නේ

i ලේනා ගැනය ii වඳුරා ගැනය iii හාවා ගැනය

(35) අප ඖෂධීය පානයක් ලෙස ගන්නා මල් වර්ගයකි

i කතුරුමුරුංගා ii රණවරා iii කෝපි

(36) වේල් පෙරහැර පවත්වනු ලබන ජාතිකයින් වන්නේ

i සිංහල ii දෙමළ iii මුස්ලිම්

(37) අප රට සම්පූර්ණයෙන් ම බ්‍රිතාන්‍යයන්ට යටත් වූයේ i) 1948 ii) 1550 iii) 1815

(38) කඳෙහි මල් හට ගන්නා ශාකයක් වන්නේ i අත්තික්කා ii කොහොඹ iii ඇහැල

(39) මලක කොටසක් නොවේ i පෙති ii නටුව iii දලු

(40) මල්වල පැණි බීම සඳහා නොඑන සතෙකි i ලේනා ii වවුලා iii සැවුලා

(41) කෘත්‍රිම ලෙස සකස් කරන ලද ආහාර වර්ගවල දැකිය නොහැක්කේ

i රසවත් බව ii ආකර්ෂණීය පෙනුම iii ඖෂධීය ගුණයෙන් යුක්ත බව

(42) අනාරක්ෂිත අවස්ථාවක් වන්නේ

i පාලුවට ගිය ළිඳක් ii සර්පයන් සහිත තුඹසක් iii අකුණු සහිත අවස්ථාවක එළිමහනේ සිටීම

(43) උල්පත් ජලය i කළුපාටය ii අවර්ණය iii සුදුපාටය

(44) මෙම රූපයේ සිටින්නේ 

i තොටගමුවේ ශ්‍රී රාහුල හිමිය ii එස් මහින්ද හිමිය iii වාරියපොළ ශ්‍රී සුමංගල හිමිය

(45 )අතීසාරය රෝගය බෝවිය හැක්කේ

i මදුරුවන් මගින් ii අපිරිසිදු ආහාර මගින් iii මැක්කන් මගින්

(46) රෝගී ශාකයක ලක්ෂණයක් වන්නේ

i පත්‍ර හොඳින් කහ පැහැ ගැන්වී තිබීම ii මල් හොඳින් හට ගැනීම iii හොඳින් වර්ධනය වීම

(47) ශක්ති වර්ධක ආහාරයකි i කොස් ii බිත්තර iii මස්



(48) මෙම රූපයෙන් දැක්වෙන්නේ i ඉස්කුරුප්පු නියන ii ස්පැනරය iiiකටර් අඬුව

(49) ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව වන්නේ i ක්‍රිකට්ය ii පාපන්දු ය iii වොලිබෝල්ය

(50) "රන් දැකැති ගෙන නිති සැරසෙනවා" කවිය i පාරු කවියකි ii ගොයම් කවියකි iii කමත් කවියකි

(51) කපුටාගේ කූඩුවේ බිත්තර දමන පක්ෂියා වන්නේ

i ගිරවා ය ii කොණ්ඩ කිරිල්ලිය iii කෙවිලිය

(52) අපට දිවා කාලය හා රාත්‍රී කාලය උදාවන්නේ

iඉර බැස යන නිසා ය ii පෘථිවි ගෝලයේ භ්‍රමණය නිසාය iii සූර්යයාගේ භ්‍රමණය නිසාය

(53) බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්කයක් නොවන්නේ iකොළඹ iiගම්පහ iiiනුගේගොඩ

(54)විශේෂිතවූ නලා හඬක් මගින් හඳුනා ගතහැකි වාහන වර්ගයකි

iගිලන්රථ iii ලංගම බස්රථ iiiආපදා රථ

(55) පහත සතුන් අතරින් භෝග වගාවට හිතකර සතෙක් වන්නේ

iගැඩවිලා ii දළඹුවා iii කුරුමිණියා

(56)විටමින් A ඌනවීමෙන් ඇතිවිය හැකි රෝගී තත්ත්වයකි

i අස්ථි දුර්වලවීම ii ඇස්පෙනීම දුර්වලවීම iii ශක්තිය හීනවීම

(57)තම ආරක්ෂාවට ශරීර වර්ණය වෙනස් කරන සතෙක් වන්නේ

i මොනරා ii කටුස්සා iii කුකුළා

(58) වතුර අඩුවෙන් පානය කිරීම නිසා ඇතිවිය හැකි දෙයකි

i සිරුරේ ප්‍රාණවත් ගතිය ඇතිවීම

ii මුත්‍රාවල වර්ණය තද කහ පැහැති වීම

iii පහසුවෙන් මුත්‍රාකළ හැකි වීම (ලකුණු 1x 30 )

**<u>සැකසුම : සන්ධ්‍යා සමරසිංහ මිය</u>**

**<u>අනුලා විද්‍යාලය,නුගේගොඩ</u>**